# ශ්‍රී ලංකාවේ විවිධ ස්ථානවලින් හමුවන අක්ෂර නොවන සංකේත පිළිබඳ විමසුමක්

**කැලේගම ජිනරතන හිමි**

ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, සමාජීයවිද්‍යා හා තුලනාත්මක අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය, අනුරාධපුර.

**Abstract**

Many of Symbols which are not considered as letters were found in dealing with the archeological activities from last period of the 19th century up to date in Sri Lanka. Occasionally, these have been mentioned in the places where letters were available, and some of which have been denoted alone. These were noted on the various materials like stone, clay, metal, talipot. In addition to thousands of symbols found in various places in our country, many such symbols as these were found in the various places in the world. Also there are such symbols as these are found among the paintings drawn by the men who lived before and after the advent of the characters. Many of evidences of using these symbols for their paperwork have been found specially since the beginning of the civilizations. Symbols like these were created by men with a view to any of the purposes whatsoever through the experiences gained over thousands of years ago. What is considerable here is that the language ability, which is considered as a special capability obtained in the human evolution, has affected this. In examining the history of using this system of symbols for the language ability , these symbols occupy a central position. It is because of the fact that at the beginning, symbols like this have been used for representing the language. Communication activities have made a great impact on the regular development of human society. According to the archaeological and anthropological researches currently occurred, Homo habilis were concerned as the first human group who used language at the human evolution. Human group who lived after them have used the term language, in a more advanced manner. It is accepted that, by the period of upper Paleolithic era, symbols were used by ancient people for the communication activities in human evolution. Environmental

experiences were used for creating the symbols when doing their living activities. This has played a major for forming the alphabets used for writing activities in the later ages. It should be considered why these symbols were used by those people because these symbols considered as non letters have been used by the ancient people for the various reasons in many parts of the island. When observing these various symbols, it can be concluded that these symbols can be identified as letters belong to the dead language or belong to the religious language which does not exist at present.

***Key Words*** : symbols, letters, communication, dead language, religious language.

**හැඳින්වීම**

මිනිසුන් ක්‍රමයෙන් පරිණාමය වෙමින් පැමිණි ගමනේ දී අත්පත් කරගන්නා ලද දැනුම් පද්ධතියෙහි අද්විතීය අංගයක් ලෙස ලේඛන කලාව හැඳිනගත හැකි ය. ලේඛන කලාවට පිවිසීම ක්ෂණික ව සිදු වූවක් නොව ක්‍රමිකව සිදු වූවකි. එම ක්‍රමික ක්‍රියාවලියේ ආරම්භය සටහන් වන්නේ ප්‍රාග් ඓතිහාසික යුගයෙහි විසූ පිරිස් සිය අදහස් සන්නිවේදනය කිරීම සඳහා අඳින ලද චිත්‍ර සටහන් තුළිණි. මෙසේ චිත්‍ර සටහන් ඇඳීමේ හුරුව මිනිසුන් ශිෂ්ටාචාරගත වූ පසුව ද සන්නිවේදන කටයුතු වෙනුවෙන් භාවිතයට ගෙන ඇත. ක්‍රි.පූ. 4000 දී පමණ මිනිසුන් පළමුවරට ශිෂ්ටාචාරගත වූ මෙසපොතේමියානු ශිෂ්ටාචාරයේ පටන් ඉන් පසු බිහි වූ සෑම ශිෂ්ටාචාරයක ම මෙවැනි චිත්‍ර සටහන් විවිධ අමුද්‍රව්‍ය මත සටහන් කොට සන්නිවේදන කටයුතු සඳහා භාවිත කොට පැවති බව පුරාවිද්‍යාත්මක ක්‍රියාකාරකම් තුළින් හෙළි වී ඇත. වර්තමානයේ දී ලොව පවත්නා විවිධ භාෂා සංකේතවත් කිරීම සඳහා නිර්මාණය කොටගෙන ඇති අක්ෂර පද්ධතිවල ආරම්භය සඳහා උපකාරී වී ඇත්තේ ප්‍රාග් ඓතිහාසික යුගයේ පටන් මිනිසුන් භාවිත කළ එවැනි චිත්‍ර සටහන් ය. මිනිසුන් අක්ෂර කලාවක් නිර්මාණය කරගත් පසුව ද විවිධ අරමුණු වෙනුවෙන් විශේෂයෙන් ම විවිධ අදහස් ධ්වනිතාර්ථවත් කිරීමට මෙම සංකේත බොහෝවිට භාවිත කොට ඇත. එවැනි සංකේත පසු අවස්ථාවන්හි දී ද භාවිතකොට ඇති බවට වන සාධක ඇතැම් ශිලා ලේඛන හා මැටිබඳුන් මත ඒවා සටහන් කොට පැවතීමෙන් පෙනී යයි. ශ්‍රී ලංකාවේ බොහෝ ස්ථානවල සිදු කරන ලද පුරාවිද්‍යාත්මක පර්යේෂණ මගින් ද එවැනි සංකේත බොහෝ ප්‍රමාණයක් සොයාගෙන ඇත. මෙම අධ්‍යයනයේ දී එවැනි සංකේත, එම සංකේත සටහන් කිරීමේ අරමුණු හා ඒවායින් සන්නිවේදනය කොට ඇති අදහස් පිළිබඳ විමසීමක් සිදුකෙරේ.

**පර්යේෂණ ගැටලුව**

ලෝකයේ බොහෝ ප්‍රදේශවලින් මෙන් ම මෙරට බොහෝ ස්ථානවලින් ද අක්ෂර සේ නොසැලකෙන විවිධ වර්ගවලට අයත් සංකේත බොහෝ ප්‍රමාණයක් හමු වී තිබේ. මෙම සංකේත පිළිබඳ විවිධ මට්ටමේ අධ්‍යයනයන් සිදුකර පැවතිය ද ඒවා ප්‍රමාණවත් ලෙස සැලකිය නොහැකිය. එබැවින් මෙම සංකේත පිළිබඳව නිශ්චිත අදහසක් ඉදිරිපත් වී නොමැත. එම නිසා මෙම සංකේතවල උපයෝගිතාව කෙසේ වූවේ ද යන පර්යේෂණ ගැටලුවේ වලංගුතාව තවදුරටත් පවතී.

**පර්යේෂණ විධික්‍රම**

මෙම අධ්‍යයනයේ භාවිත පර්යේෂණ විධික්‍රම වන්නේ පුරාවිද්‍යාත්මක අධ්‍යයනයන්හි දී භාවිත කෙරෙන පර්යේෂණ විධික්‍රමවලට අනුව සිදු කිරීමයි. ඒ යටතේ ක්ෂේත්‍ර අධ්‍යයනය, පුස්තකාල අධ්‍යයනය, කෞතුකාගාර අධ්‍යයනය යනා දී විධික්‍රම භාවිත කරනු ලැබීය.

**සාකච්ඡාව**

**සංකේත සටහන් නිර්මාණය වීමේ පසුබිම**

සිය ආහාරය සඳහා ආරම්භක හෝමෝ ගණයේ පිරිස් වැඩි වශයෙන් මාංශ යොදාගැනීම නිසා එම පිරිස් වඩාත් විමසිලිමත්ව හා සැලසුම් සහගතව තම එදිනෙදා කටයුතු සිදු කර ගැනීමට කටයුතු කොට තිබේ. දඩමස් මස් ලබා ගැනීම සඳහා එකට එක්ව ක්‍රියා කිරීමට හුරු වූ මුල් හෝමෝ පිරිස් සිය දෛනික කටයුතු සැලසුම් කොට ක්‍රියාවට නැගීම සඳහා සරල ආකාරයේ සන්නිවේදන ක්‍රමයක් අනුගමනය කරන්නට ඇති බව අනුමාන කෙරෙයි. එම ක්‍රමය වන්නේ මාංශ භක්ෂණයට යොමුවීමත් සමග සිදුවූ මොළයේ වර්ධනය සමඟ ඇති වූ භාෂාමය හැකියාවයි. එසේ අනුමාන කෙරෙන්නේ ක්‍රමයෙන් බුද්ධිය වර්ධනය වීම, තාක්ෂණය දියුණු වීම, ජීවනෝපාය රටා සංකීර්ණත්වයට පත් වීම, සන්නිවේදනය දියුණු වීම යනා දී ලක්ෂණ අතර එකිනෙකට බද්ධ සම්බන්ධයක් තිබීම නිසාය (කුලතිලක, 2018:147).

මානව පරිණාමයේ දී හෝමෝ සේපියන්ස් හෙවත් නූතන මිනිසා දක්වා පැමිණි ගමන් මගේ ආදිතමයන් වන ඔස්ට්‍රලෝපිතකස්, හෝමෝ හැබිලිස්, හොමෝ ඉරෙක්ටස්, වැනි මානව පවුලේ සාමාජිකයන් ද කලින් කලට ක්‍රමයෙන් දියුණු කරගත් ශබ්ද රටා ඇසුරු කරගත් සන්නිවේදන ක්‍රමයක් අනුගමනය කර ඇති බැව් ගම්‍ය වෙයි. එසේ වුවද සංකේතානුසාරීව පෝෂණය වී ඇති භාෂාමය හැකියාව වර්ධනය වන්නට ඇත්තේ අදින් වසර 200,000 කට පමණ පෙර පටන් බව විශ්වාස කෙරේ. මිනිසුන් විසින් ඇති කරගනු ලබන සමාජ සබඳතා හා සමාජ සංවිධාන ක්‍රම අයත් වන සංස්කෘතික උරුමය ආරක්ෂා වී ඉදිරියට ගමන් කරන්නේ මෙම භාෂාමය හැකියාව පදනම් කරගෙනය (එම:223).

මානව පරිණාමයේ දී අන්‍ය සත්ත්වයන්ගෙන් වෙන් වී ඔවුන්ට වඩා දියුණු චින්තන ශක්තියක් සහිත සත්ත්ව කොට්ඨාශයක් බවට පත් වීමට මිනිසාට ඉවහල් වී ඇත්තේ භාෂාවයි. එසේ ම ඕනෑම මානව සමාජයක සාමාජිකයන්ට එකිනෙකා අතර සබඳතා තර කර ගැනීමටත් ඔවුන්ගේ අදහස් එකිනෙකා වෙත ප්‍රකාශ කරගැනීමටත් ඉවහල් වන ප්‍රධානතම සාධකය වන්නේ භාෂාවයි (ගුණසේකර, 2009:15). එනිසා භාෂාව යන්න ආරම්භයේ සිට වර්තමානය දක්වා මානව සමාජය සුරක්ෂිත කොට ගෙන ඉදිරියට පවත්වාගෙන ඒමට ඉවහල් වූ ප්‍රධානත ම මාධ්‍ය සේ සැලකිය හැකි ය.

ඉතා ඈත අවධියේ සිට ම මිනිසුන් විසින් සන්නිවේදන කටයුතු සඳහා විවිධ ක්‍රියාමාර්ග අනුගමනය කර ඇත. ඒ අතර අංග චලන භාවිතය, චිත්‍ර සටහන් යෙදීම, ශබ්ද විධි අනුගමන කිරීම හා වෙනත් සංකේත භාවිත කිරීම ආදිය වැදගත් ය. මේවා භාෂා වශයෙන් නොසැලකෙන අතර භාෂා මාධ්‍ය තනා ගැනීම සඳහා මෙම සන්නිවේදන මාධ්‍ය උපකාරී වී තිබේ. මිනිසුන් සතු සුවිශේෂී සංස්කෘතිකාංගයක් වන

භාෂාව යන්නෙන් අදහස් කෙරෙනුයේ ශබ්ද රටා සමුදායකි. මෙම ශබ්ද රටා මනසෙහි සිදුවන ක්‍රියාකාරීත්වය අනුව අරුත් දනවමින් මුවින් නිකුත් වන්නකි (එම:16,17).

මානව පරිණාමයේ දී හමු වන මුල්ම ''හෝමෝ'' ගණයේ සාමාජිකයා වන ''ශක්‍ය මානවයා'' වශයෙන් හඳුන්වනු ලබන ''හෝමෝ හැබිලිස්'' ද්‍රව්‍ය සංස්කෘතියේ ඉදිරිගමනට අඩිතාලම දැමූ පළමු පිරිස ලෙස හැඳින්වෙයි. මොවුන් ''ශක්‍ය මානවයා'' යන නාමයෙන් හඳුන්වන්නේ ද වඩාත් සාර්ථකව ශිලා ආයුධ නිපදවමින් එම කාර්යයෙහි නිරත වූ බැවිණි. මෙම මානවයා මීට වසර මිලියන 2.4 - 1.5 අතර කාලයේ දී අප්‍රිකානු ප්‍රදේශ කේන්ද්‍ර කොටගෙන ජීවත්ව සිට තිබේ. ප්‍රාග් මානව විද්‍යාඥයන්ට හමු වී ඇති හෝමෝ හැබිලිස්ගේ යැයි සැලකෙන ඇටසැකිල්ලකට අයත් කපාල ආකෘතියක බ්‍රෝකාගේ පෙදෙස යනුවෙන් හඳුන්වනු ලබන මිනිස් මොලයෙහි භාෂාමය හැකියාව හා කථනය පාලනය කරන කොටස වර්ධනය වී නෙරා ගොස් ඇති බව තහවුරු වී ඇත. එනිසා හෝමෝ හැබිලිස් මානවයාට ප්‍රාථමික මට්ටමේ භාෂාමය හැකියාවක් පැවති බව දක්වයි. එනිසා ම ඔහු වාචිකව භාෂාව හැසිරවීමේ ආරම්භකයින් ලෙස සැලකේ (කුලතිලක, 2018:140,141,142). එසේ වුව ද මානව පරිණාමයේ ආරම්භක කාලච්ඡේදයට අයත් අර්ධ මානව තත්ත්වයේ සිටි ඔස්ට්‍රලෝපිතකස් පවා සන්නිවේදනය සඳහා කිසියම් භාෂාවක් භාවිත කළ බවට අනුමාන කෙරේ (වජිර හිමි, 2000:6).

භාෂාව යන්න අන්‍ය සත්ත්වයන් වෙතින් මිනිසා වෙන් කෙරෙන සිය පරිණාමයේ දී ඔහු විසින් උරුම කරගන්නා ලද සුවිශේෂී ශක්‍යතාවක් ලෙසින් සැලකේ. එනිසා ම එය ''භාෂා ශක්‍යතාව'' යනුවෙන් සුවිශේෂී කොට විද්වතුන් විසින් හඳුන්වා තිබේ. එසේ ම භාෂාව යන්න මිනිසා විසින් උරුම කොටගෙන ඇති සුවිශේෂී ශක්ති ප්‍රවාහයක් වශයෙන් ද සලකනු ලැබේ (දිසානායක, 2005,:20).

මිනිසා සතු මෙම භාෂා ශක්‍යතාවෙහි අංශ ද්විත්වයක් පවතී. ඒ ශබ්ද මාධ්‍ය හා රූප මාධ්‍ය යනුවෙනි. මෙහිදී ශබ්ද මාධ්‍ය කොටගත් භාෂාව ''භාෂණය'' යනුවෙන් හඳුන්වනු ලබන අතර රූප මාධ්‍ය කොටගත් භාෂාව ''ලේඛනය'' යනුවෙන් හඳුන්වනු ලබයි (එම:20). භාෂාව රූප මාධ්‍යයෙන් සංකේතවත් කොට දැක්වීම සඳහා මිනිසුන් විසින් යොදාගත් උපක්‍රමය ලෙස විවිධ රූප සංකේත ඇඳ දැක්වීම හා අක්ෂර භාවිත කිරීම හැඳින්විය හැකි ය.

ප්ලයිස්ටෝසීන අවධියේ ඉතා මෑතම අවස්ථාව වන අදින් වසර 75,000 - 10,000 අතර කාලයෙහි ජීවත්ව සිටි හෝමෝ නියැන්ඩර්තාල් මානවයින් පෙර සිටි මානවයින්ට වඩා දියුණු අන්දමින් සන්නිවේදන හැකියාවක් සහිතව කටයුතු කොට තිබේ. ඔවුන් සන්නිවේදනයේ දී කථනය හා සංකේත භාවිත යන දෙඅංශයම යොදාගෙන ඇති බව තහවුරු වී ඇත (කුලතිලක, 2018:197).

**භාෂාවේ සංකේත භාවිතය**

භාෂාවක ඇති සංකේත යනුවෙන් අදහස් කෙරෙන්නේ කුමක් දැයි විමසීමේ දී එයින් හැගෙන අර්ථය තරමක් ගැඹුරින් වටහා ගත යුතුව ඇත. ''සංකේතය'' යන්න ඉංග්‍රීසි භාෂාවෙන් Symbol යන පදයෙන් හඳුන්වයි. මෙහි අර්ථය එක් වස්තුවක් හැඟවීමට යොදන වෙනත් වස්තුවක් යැයි අර්ථ ගන්වයි. උදාහරණ ලෙස බුදුසමය හැඟවීමට ධර්ම චක්‍රය යෙදීම, ක්‍රිස්තියානි ආගම හැඟවීමට කුරුස යෙදීම ආදිය භාවිත කෙරෙන්නේ සංකේත වශයෙනි (දිසානායක, 2005:23).

සංකේත සහ එයින් හැඟවෙන අනෙක් වස්තු අතර පවතින්නේ තාර්කිකව ග්‍රහණය කරගත හැකි සබඳතාවක් නොවේ. ඒවා අතර ඇත්තේ සම්මුති මගින් මිනිසුන් අතර ඇතිකරගත් සබඳතා පමණි. එකම දේ අදහස් කිරීමට විවිධ භාෂාවල විවිධ පද ඇති වී ඇත්තේ මෙම නිසාය. එනිසා ම භාෂාව යන්න සංකේත සමුදායක් වශයෙන් අදහස් කෙරේ (එම:23,24,25).

මහාශිලා යුගයේ ඉහළ අවස්ථාව වන විට සන්නිවේදන කටයුතු සඳහා සංකේත භාවිත කොට ඇති බව පිළිගැනේ. ක්‍රමයෙන් සමාජය සංවර්ධනය වත්ම ඔස්ට්‍රලෝපිතකස්ගෙන් පසුව සිටි ආදි කාලීන මානවයින් හට තමන්ගේ එදිනෙදා කටයුතු සිදු කිරීමේ දී තමන් අසල නොසිටි පිරිස් වෙත යම් යම් දෑ පිළිබඳ දැනුම් දීමත්, තමන් පරිසරය ඇසුරින් ලබන දැනුම ගැන යම් යම් දේ මතකයේ තබා ගැනීමත් වෙනුවෙන් යම්කිසි සන්නිවේදන ක්‍රියාකාරකමක අවශ්‍යතාව පැන නගින්නට ඇතැයි අනුමාන කෙරේ. මෑත කාලීනව පවා ඇතැම් ගෝත්‍රික ජනතාව අතර පවතින සන්නිවේදන කටයුතු සඳහා අනුගමනය කරන සිරිත් අතර වනයේ ගමන් කරන විට මඟ සලකුණු ලකුණු කිරීමට හා වෙනත් අභිචාර කටයුතු වෙනුවෙන් කොළ අතු කඩා දැමීම, කොළ අතු එල්ලීම හා ආයුධයකින් ගස්වලට කොටා යම් යම් සලකනු තැබීම ආදී දේ සිදු කරයි. ආදි කාලීන මානවයින් ද මෙවැනි කටයුතු අනුගමනය කරන්නට ඇතැයි සිතිය හැකි අතර එවැනි සන්නිවේදන ක්‍රම පියවරෙන් පියවර දියුණු වී පසුව වෙනත් සන්නිවේදන ක්‍රම බිහි වන්නට ඇතැයි සිතිය හැකි ය (වජිර හිමි, 2000:6).

මානව පරිණාමයේ දී විශාල සංස්කෘතික දියුණුවක් අත්පත් කරගත් පිරිසක් ලෙස සාමාන්‍ය වශයෙන් අදින් වසර මිලියන 1.8 සිට අවුරුදු 400,000 දක්වා වාසය කළේ යැයි සැලකෙන හෝමෝ ඉරෙක්ටස් මානවයින් සලකනු ලැබේ. ගින්දර භාවිතය ඇරඹීම, වස්ත්‍ර දැරීම ආදී ලක්ෂණ රැසක ආරම්භකයින් මොවුන් වූ නිසා ම මෙම මානව පිරිස පරිණාමයේ දී සුවිශේෂිත්වයක් හිමිකර ගෙන ඇත. හෝමෝ ඉරෙක්ටස් මානවයින් සාමූහිකව හා සැලසුම් සහගතව සතුන් දඩයම් කළ පිරිසක් බව පැහැදිලිව හැඳිනගෙන තිබේ. ඒ සඳහා ඔවුන් මැනවින් සංවිධානය වී කටයුතු කොට ඇත. මෙතරම් සංවිධිත අයුරින් මෙම පිරිස කටයුතු කළ නිසා ම සමාජ සබඳතා පවත්වා ගැනීමේ දී සන්නිවේදන ක්‍රියාවලිය සඳහා සංකේතාත්මක සන්නිවේදනය (Symbolic Communication) සහ අදහස් ප්‍රකාශ කිරීම සිදු කළ බවට මතයක් තිබේ. යුරෝපයෙන් හමු වී ඇති ඇචූලියන් සම්ප්‍රදායට අයත් ආයුධ අතර සත්ත්ව අස්ථි මතුපිට කලාත්මකව සිදුකරන ලද සීරුම් සලකුණු හමුවී තිබීම හා ඉන්දියාවේ ඇචූලියන් ආයුධ සම්ප්‍රදායට අයත් සාධක ඇති ගල් ගුහාවක තිබී ඉතා සරළ මට්ටමේ ශිලා කැටයම් පෙළක් සොයාගෙන තිබීම නිසා ඒවා තුළින් ඉරෙක්ටස් මානවයින්ගේ සංකේතාත්මක හැසිරීමට (Symbolic Behaviour) අදාළ තොරතුරු අනාවරණය වී ඇත (කුලතිලක, 2018:164). මෙම සොයා ගැනීම නිවැරදි වන්නේ නම් සංකේත ඇසුරින් සන්නිවේදන කටයුතු කළ ලොව මුල්ම පිරිස වන්නේ හෝමෝ ඉරෙක්ටස් මානව කණ්ඩායමයි.

මෙවැනි සන්නිවේදන කටයුතු සඳහා ආදි කාලීන මානවයින් බොහෝ සෙයින් තමන් පරිසරයේ දී අත්විඳින ස්වභාවික වස්තු රූපයට නඟා ඇති බවත් දැකිය හැකි ය. මෙලෙස සිය සන්නිවේදන කටයුතු වෙනුවෙන් යොදාගත් මාධ්‍ය ලෙස චිත්‍ර රූප සටහන් කිරීම නිසා පසු අවස්ථාව වන විට ලේඛන කටයුතු සඳහා භාවිත කෙරෙන අක්ෂර මාලාව නිපදවා ගැනීමට හැකිවී ඇත (වජිර හිමි, 2000:6).

ප්‍රාථමික අවධිවල සිටි මානවයින් තම සිතැගියාවන් අන් අයට සන්නිවේදනය කිරීම සඳහා විවිධ සංකේත භාවිත කොට තිබේ. දඩයම සඳහා වනයේ දින කීපයක් ගෙවීමට සිදු වන විට නැවත සිය වාසස්ථාන කරා පැමිණෙන දින ගණන සන්නිවේදනය කිරීම සඳහා සූර්යයා සංකේතවත් වන රූප කීපයක් තමන් වාසය කළ ගල්ලෙනෙහි ඇඳීමෙන් එම දින ගණන දක්වා ඇත (අමිල හිමි, 1999:1).

අදින් වසර ලක්ෂ දෙකකට පමණ පෙර සිට පැවත එන වර්තමාන මිනිසා අයත් වන හෝමෝ සේපියන්ස් මානවයින් පෙර සිටි මානව වර්ගවලට වඩා සංවිධිත අයුරින් සමාජය සංවිධානය කර ගත් පිරිසකි. පළමුවරට ගල්ලෙන් තුළ චිත්‍ර සටහන් කරනු ලබන්නේ මෙම පිරිසය. එවැනි චිත්‍ර සහ සංකේත භාවිතයෙහි සුලබ බව සිදුවන්නේ මෙම පිරිස වෙතිනි (කුලතිලක, 2018:201).

හෝමෝ සේපියන්ස් හෙවත් නූතන මානවයින් විසින් සංකේත භාවිතය ඉතා ඉහළ අයුරින් සිදු කොට ඇත. අදින් වසර 40,000 ටත් වඩා ඈත අවධියක පටන් නූතන මිනිසා විසින් අඳින ලද විවිධ සංකේත හා චිත්‍ර අප්‍රිකාව, ඕස්ට්‍රේලියාව හා යුරෝපය යන මහද්වීපික ප්‍රදේශවලින් හමු වී තිබේ. නියැන්ඩර්තාල් මානවයින්ට වඩා දියුණු ආකාරයෙන් සංකේත භාවිතයට ගත් නූතන මිනිසුන් තමන්ගේ හැඟීම් ප්‍රකාශ කිරීමට කලාත්මක නිර්මාණ වැඩි වශයෙන් සිදු කොට තිබේ. එවැනි සාධක සහිත ස්ථානවලට අයත් පුරාවිද්‍යාත්මක සාධක බොහෝ සෙයින් ලැබී ඇත. ප්‍රංශයේ ලැස්කෝ, නැමීබියාවේ ඇපලෝ සස, ඕස්ට්‍රේලියාවෙ කාපෙන්ටර් ගැප් ආදී ස්ථාන ඒ සඳහා නිදසුන් ය. එසේ ම නූතන මිනිසුන්ගේ ආරම්භක අවධියට අයත් සශ්‍රීකත්වය සංකේතවත් කරන ස්ත්‍රී රූප (වීනස් රූප) ද ඇත. ඒ අතර ඇති වසර 24000 ක් පැරණි විලෙන්ඩොෆ් ස්ත්‍රී රූව ඉතා ප්‍රකට ය (එම:227,228).

මිනිසා විසින් පසු අවධියක දී තමන් විසින් ව්‍යවහාර කරන භාෂාව සංකේතාත්මකව දැක්වීම සඳහා අක්ෂර මාලාවක් තනාගෙන ඇත. එසේ අක්ෂර මාලාවක් නිපදවා ගැනීම එක්වර සිදුවූවක් නොව කලින් කලට දියුණු වූ අදහස් සමුදායක ප්‍රතිඵලයක් ලෙස අක්ෂර මාලාව වර්ධනයවී තිබේ. මිනිසා අක්ෂර මාලාවක් නිර්මාණය කර ගැනීමේ පියවර 1952 දී ගැල්බ් විසින් යුග හතරකට බෙදා දක්වා තිබේ. ඒ චිත්‍රාක්ෂර (pictographs) හෙවත් රූප සලකුණු කිරීම මගින් භාෂාව විෂධ කළ අවධිය, ලඝු සංකේත අක්ෂර (Logographs) හෙවත් නිශ්චිත වචනයක් වෙනුවට සටහනක් යොදා චිත්‍රයක් භාවිත කළ අවධිය, ශබ්ද සංකේත අක්ෂර (Syllabic Writings) හෙවත් වාක්‍ය ඛණ්ඩ, අදහස් හෝ ශබ්ද වෙනුවට රූප භාවිත කළ අවධිය හා ශබ්දක්ෂර (Phonems) හෙවත් ශබ්ද හුවා දැක්වීම සඳහා අක්ෂර භාවිතා කළ අවධිය වශයෙනි (වජිර හිමි, 2000:6).

සංකේතයක් වශයෙන් සාමාන්‍ය වශයෙන් හඳුන්වන්නේ එක් දෙයක් නිරූපණය කිරීමට වෙනත් දෙයක් යෙදීමයි. සංකේත භාවිත කිරීම මූ මූලික සංකේතීකරණය හා ද්විතියික සංකේතීකරණය යන ක්‍රමවේද දෙක ඔස්සේ බොහෝ දුරට යොදනු ලැබේ. මූලික සංකේතීකරණය යනු සෑම සිදුවීමකට ම අදාළව සංකේත පැවැතීමයි. ද්විතියික සංකේතීකරණයේ දී සිදුවන්නේ සංකේත කුඩා ප්‍රමාණයක් ඇසුරින් සිදුවීම් බොහෝ ප්‍රමාණයක් ගෙන හැර දැක්වීම යි. භාෂාවල මෙම අංශ දෙකට ම අයත් ව සංකේතීකරණය සිදුවෙයි (කරුණාතිලක, 2006:36,37).

මිනිසා භාෂාවක් බිහිකර ගැනීමේ මූලික අරමුණ වන්නේ සමාජය බිඳ නොවැටී මනා අයුරින් පවත්වාගෙන යාමයි. සමාජය මැනවින් පවත්වාගෙන යාමට නම් එහි සාමාජිකයන් එකිනෙකා අතර සබඳතා පවත්වාගෙන යා යුතුවේ. එය ක්‍රියාවට නැංවිය හැකි වන්නේ සන්නිවේදනය පදනම් කොටගෙනය. භාෂාව යනු ඒ සඳහා ඇති ප්‍රබලතම සන්නිවේදන මාධ්‍ය සේ සලකනු ලබයි. සන්නිවේදනය යන්නෙන් අදහස් කෙරෙන්නේ අදහස් හුවමාරු කරගැනීමයි. එහි ද සිය හැඟීම් පළ කිරීමට හා තොරතුරු හුවමාරු කරගැනීම සඳහා භාෂාව යොදා ගනී (දිසානායක, 2005:33).

භාෂාවෙහි ''කියන බස'' හා ''ලියන බස'' යනුවෙන් වර්ග කිරීමක් පවතී. මින් ''කියන බස'' යනුවෙන් අදහස් කෙරෙන්නේ කතාබහ කිරීම සඳහා භාවිත කරන බස් වහර ය. ''ලියන බස'' යනුවෙන් අදහස් කෙරෙන්නේ ලිවීමේ කටයුතු සඳහා භාවිත කෙරෙන බස් වහර ය. මෙවැනි බෙදීමක් පවතින්නේ ලේඛන ක්‍රමයක් පවතින භාෂාවන්හි පමණය. මින් ''කියන බස'' නිර්මාණය වන්නේ කණට ශ්‍රවණය වන ශබ්ද ඇසුරෙනි. ''ලියන බස'' නිර්මාණය වන්නේ ඇසට දර්ශනය වන රූප හෝ අක්ෂර ඇසුරෙනි (එම:66).

නූතන මිනිසා සිය ආරම්භක අවධියේ පටන් ම කෙනෙකු මියගිය පසු භූමදාන කටයුතු පිළිබඳ සැලකිලිමත් වී තිබේ. දේහ භූමදානය කිරීමේ දී අනුගමනය කරන ලද අභිචාරීමය කටයුතු රැසකි. එහි දී ද්‍රව්‍යමය දේ හා පූජා භාණ්ඩ තැන්පත් කිරීම, දේහය අසල සංකේතාත්මක ද්‍රව්‍ය තැන්පත් කිරීම හා දේහයන් වකුටුකොට වළ දමා ඒ තුළින් උපත හෝ පරලොව වැනි අදහසක් සංකේතවත් කිරීමට යත්න දැරීම, භූමදානය කළ අස්ථි නැවත මතුකර ඒවා වර්ණ ගන්වා නැවත වල දැමීම වැනි කටයුතු සිදු කොට ඇත. මෙම සියලු ක්‍රියාවන් තුළින් නිරූපණය වන්නේ ඉතා ගැඹුරු සිතුම් පැතුම් සමුදායක් සංකේතවත් කිරීමට උත්සාහ දරා ඇති බවයි (කුලතිලක, 2018:230). මෙසේ කිසියම් සංකේතයක් ඇසුරින් අදහසක් ගම්‍ය කිරීමට හුරු වූ ආදි මානවයින් එය සිය සන්නිවේදන කටයුතු සඳහා යොදාගත් භාෂාව සඳහා ද ආරෝපණය කොටගෙන ඇත.

**ශ්‍රී ලංකාවෙන් හමුවන සංකේත**

කිසියම් භාෂාවක් ව්‍යවහාරයට පැමිනෙන්නේ මිනිස් සමාජයක් තුළ ය. සමාජයක් බිහි වන්නේ කිසියම් රටක වෙසෙන මිනිසුන්ගේ එකතුවෙනි. එම රටේ මිනිසුන් වෙනත් රටක හෝ ප්‍රදේශයකට ගොස් පදිංචි වුවහොත් එම පිරිස භාවිත කරන භාෂාව ක්‍රමක්‍රමයෙන් වෙනස් වීමකට ලක්වෙයි (දිසානායක, 2005:73). ඒ අලුතින් පදිංචි වූ රටේ හෝ ප්‍රදේශයේ පවත්නා සාමාජීය බලපෑම ට අලුතින් පදිංචි වන පිරිස නතුවීම නිසා ය. එනිසා මෙරටින් ලැබෙන මෙම සංකේත අපට රටට පරිබාහිරින් පැමිණි ආදිකාලීන පිරිසක් විසින් රැගෙන එන ලද ඒවා සේ සිතිය හැකි ය.

භාෂාවල දැකිය හැකි පොදු ලක්ෂණයක් වන්නේ විවිධ ප්‍රභේද පැවතීමයි. එසේ විවිධ ප්‍රභේද ඇතිවීම සඳහා බලපානු ලබන කරුණු කාරණාවන් රැසක් ද වෙති. එහි දී අදාළ භාෂා භාවිත, වන රට ප්‍රදේශය, අවස්ථාව, ස්ථානය ආදී සාධක මෙන් ම එම භාෂාව ව්‍යවහාර කරන පිරිසේ කටයුතු ද බලපානු ලබයි. එසේ ම කාලය විසින්ද භාෂාවල ප්‍රභේද ඇති කරනු ලබයි. එසේ කාලය නිසා ඇතිවන ප්‍රභේද අතර මානව උපයෝගීතාවෙන් හෙවත් භාවිතයෙන් සම්පූර්ණ වශයෙන්ම මගහැරී ඇති භාෂා වන මෘත භාෂා (Dead Language), මානව භාවිතයෙන් සම්පූර්ණ වශයෙන් ඉවත් නොවී

විශේෂ කාර්යයන් සඳහා භාවිත කරන භාෂා වන සම්භාව්‍ය භාෂා (Classical Language) හා දෛනික කටයුතු සඳහා යොදා ගන්නා භාෂා වන ජීව භාෂා (Living Language) යනා දී ප්‍රභේද වෙයි (එම:65).

කිසියම් භාෂාවක් ව්‍යවහාරයට පැමිණෙන්නේ මිනිස් සමාජයක් තුළ ය. සමාජයක් බිහි වන්නේ කිසියම් රටක වෙසෙන මිනිසුන්ගේ එකතුවෙනි. එම රටේ මිනිසුන් වෙනත් රටක හෝ ප්‍රදේශයකට ගොස් පදිංචි වුවහොත් එම පිරිස භාවිත කරන භාෂාව ක්‍රමක්‍රමයෙන් වෙනස් වීමකට ලක්වෙයි (එම:73). ඒ අලුතින් පදිංචි වූ රටේ හෝ ප්‍රදේශයේ පවත්නා සාමාජීය බලපෑම ට අලුතින් පදිංචි වන පිරිස නතුවීම නිසා ය. එනිසා මෙරටින් ලැබෙන මෙම සංකේත එසේ අපට රටට පරිබාහිරින් පැමිණි ආදිකාලීන පිරිසක් විසින් රැගෙන එන ලද ඒවා සේ සිතිය හැකි ය.

කිසියම් මානව භාෂාවක ඉදිරි පැවැත්ම සඳහා බලපාන ප්‍රධාන කාරණා තුනක් ඇත. ඒ කාල ප්‍රමාණය, දේශ ප්‍රමාණය හා ලෝක ප්‍රමාණය යනුවෙන් නම් කෙරෙන සාධකයන් ය. මෙහි දී කාල ප්‍රමාණය යනුවෙන් අදහස් කෙරෙන්නේ එම භාෂාව සමාජය තුළ භාවිතයෙහි පවත්නා කාලයයි. එම භාෂාව ව්‍යවහාර කරන දේශ සීමා දේශ ප්‍රමාණය යනුවෙන් හඳුන්වයි. ලෝක ප්‍රමාණය යනුවෙන් අදහස් කෙරෙන්නේ එම භාෂාව ව්‍යවහාරකරනු ලබන ජනතාව ගේ ප්‍රමාණය යි. මෙම අංශ ත්‍රිත්වයේ කුමන අංශයක හෝ වෙනසක් සිදු වන්නේ නම් එම භාෂාව වෙනසකට ලක් වෙයි (කරුණාතිලක, 2006:1).

ක්‍රිස්තු පූර්ව තුන්වන සියවසේ පටන් මෙරට ආරම්භ වී ඇති බ්‍රාහ්මී අක්ෂරවලින් ලියැවී තිබෙන සිංහල භාෂාව වර්තමානයේ ව්‍යවහාර කරනු ලබන සිංහල බස දක්වා ක්‍රමයෙන් පරිවර්තනය වී හැඩ ගැසී ඇත්තේ කාල ප්‍රමාණය වෙනස් වීම පදනම් කොටගෙන ය. කිසියම් ජන කණ්ඩායමක් කුමණ හෝ කරුණක් මූලික කොට ගෙන තමන් ජීවත්ව සිටින ප්‍රදේශය හෝ රට අතහැර වෙනත් ප්‍රදේශයකට හෝ රටකට සංක්‍රමණය වී සිය ස්ථිර ජනාවාස පිහිටුවාගෙන කලක් ගතවීමේ දී ඔවුන් මුල් භූමියෙහි දී ව්‍යවහාර කරන ලද බසෙහි නව්‍යතා හටගෙන එය වෙනම ස්වාධීන භාෂාවක් බවට පත්වෙයි. මෙය ස්වභාවිකව කාලය හා අවකාශය අතර සිදුවන සංසිද්ධියකි. මෙය දේශ ප්‍රමාණයෙහි වෙනස්කමක් නිසා භාෂාවේ සිදුවන වෙනසකි. යම් කාලයක දී ඉන්දියාවේ නැගෙනහිර ප්‍රදේශයෙන් පැමිණි ඉන්දු-ආර්ය භාෂාවක් කතාකළ ආර්ය ජන කණ්ඩායම් මෙරටට පැමිණ ජනාවාස ගොඩනගාගත් පසු ඔවුන් එතෙක් ව්‍යවහාර කළ බසෙහි වෙනස්කම් සිදුවී ''සිංහල'' නමැති ස්වාධීන භාෂාව ගොඩනැගී ඇත්තේ ද මෙසේ දේශ ප්‍රමාණයෙහි සිදු වූ වෙනස්කම් නිසාය. ලෝක ප්‍රමාණයෙහි වෙනස්වීම් නිසා දෙයාකාරයකින් භාෂාව වෙනස් වීමට ලක්වේ. ඒ එම භාෂාව ව්‍යවහාර කරන ජනතාව පරපුරෙන් පරපුරට වෙනස්වීම නිසා භාෂාව පරිණාමය වීමේ දී සිදු වන වෙනස්කම් හා කිසියම් පිරිසක් වෙනත් දේශයක් ආක්‍රමණය කොට සිය ආධිපත්‍ය පතුරුවා තම භාෂාව යටත් වැසියන් වෙත නැඹුරු කරවීමයි. එහි දී යටත් වැසියන් ක්‍රමයෙන් එම භාෂාව ව්‍යවහාර කිරීමට පෙළඹෙන අතර එහි බලපෑමෙන් එතෙක් පැවති භාෂාවෙහි වෙනස්කම් සිදුවේ (එම:1,2).

කාලානුරූපීව වෙනස්කම්වලට බඳුන් වීම නැතහොත් පරිණාමයට පත්වීම භාෂාවක යථා ස්වභාවයයි. භෂාවක් එසේ වෙනස්කම්වලට ලක් වන්නේ එම බස ව්‍යවහාර වීම

කේන්ද්‍රකොටගෙනය. එසේ ව්‍යවහාර නොවී කාලයත් සමඟ ව්‍යවහාරයෙන් ඉවත්වන භාෂාවකට පැවතීමක් නොමැත. එවැනි භාෂා මළ භාෂා යනුවෙන් හඳුන්වයි (එම:48).

මෙම අර්ථයෙන් ගත් කල මෙරටින් සහ ලොව විවිධ ස්ථානවලින් හමුවන අතීතයේ සිට පැවත එන විවිධ සංකේත අතීතයේ දී මානව භාවිතයෙහි පැවත තිබී මළ භාෂා බවට පත් යම්කිසි භාෂා කිහිපයක ශබ්ද සංකේතවත් කිරීම භාවිත කරන ලද අක්‍ෂර සංකේත විශේෂයක් වශයෙන් හැඳින්විය හැකිය.

ඉන්දු නිම්න ශිෂ්ටාචාරයට අයත් හරප්පා, මොහෙන්ජොදාරෝ ආදී ප්‍රදේශ ඇසුරින් සංකේතාත්මක චිත්‍රාක්ෂරවලින් ලියා ඇති මුද්‍රා ඉතා විශාල ප්‍රමාණයක් පුරාවිද්‍යාඥයන් විසින් අනාවරණය කරගෙන තිබේ. මෙම අක්ෂර හා ඊට පසු කාලයක දී ලියැවී ඇති බ්‍රාහ්මී අක්ෂර අතර යම් සබඳතාවක් පවත්නා බවත් බ්‍රාහ්මී අක්ෂර එම අක්‍ෂර ඇසුරින් නිර්මාණය වී ඇති බවට මතයක් ඇත (අමරවංශ හිමි, 1969:3,4).

මෙරට බ්‍රාහ්මී ශිලා ලේඛනවල ඇති අක්ෂර නොවන විවිධ සංකේත ඉන්දුනිම්න අක්‍ෂර හා සබඳතාවක් පැවතිය හැකි බැව් පරණවිතාන පවසයි (වජිර හිමි, 2000:9). එසේ එම අකුරු මෙරට මුල් කාලීන ශිලා ලේඛනවල ලිවීමට හේතුව වන්නේ විජය කුමරු විසූ ලාට රට හරප්පාවට ඉතා ආසන්නයෙන් පිහිටි බැවින් ඔහු මෙරටට පැමිණෙනවිට එවක එහි භාවිත වූ මෙම චිත්‍රාක්ෂර පිළිබඳ යම් අවබෝධයකින් සිටි නිසා විජය කුමරුගේ ආභාසයෙන් මෙරටට ලැබී ඇති බව ද ඔහු දක්වයි. පරණවිතාන ඉන්දු නිම්න ශිෂ්ටාචාරයට අයත් චිත්‍රාක්ෂර කියවීම සඳහා ආභාසය ලබාගෙන ඇත්තේ මෙරට මුල් කාලීන ශිලා ලේඛනවල ඇති චිත්‍රාක්ෂර ඇසුරෙනි. මහින්දාගමනයට පූර්වයෙන් මෙරටෙහි අකුරු ලිවීම පැවැති අතර එම අකුරු සඳහා ඉන්දු නිම්නයේ පැවැති චිත්‍රාක්ෂරවල ආභාසය හා අශෝක සමයට පෙර උතුරු ඉන්දියාවේ පැවති ආදිම බ්‍රාහ්මී අකුරුවල ආභාසය ද පවතී (අමරවංශ හිමි, 1969:21).

සංකේත යනු යමක් හැඟවෙන නැතහොත් අදහස් කෙරෙන සලකුණු ය. පුරාතන ඉන්දු-ආර්ය භාෂාවන්හි මෙන් ම මෙරට ඇතැම් ශිලාලේඛනවල ද අදහස් දැක්වීම සඳහා එවැනි අක්ෂර නොවන විවිධ සංකේත භාවිතකොට ඇති බැව් දැකිය හැකිවේ. මෙම ලිපි තුළ ඇති සංකේත අතර ගරාදි වැටක මධ්‍යයේ සිරස්ව ඉහළට විහිදෙන යෂ්ටියක් මත දෙපසට විහිදී යන හරක් රේඛාවක් සහිත සලකුණක් පවතී. එසේ ම එවැනි සංකේතයක් මත වම් හරස් රේකාවෙහි දක්ෂිණාවෘත්ත ස්වස්ථික සලකුණක් සහිත සංකේතයක් ද වෙයි. ඉන්දු නිම්නයේ ඇති චිත්‍රාක්ෂර තුළ ද මෙම සංකේතවලට සමාන සංකේත පවතී (එම:55, 56).

එසේම ශිලාලේඛනවල ඇති වෙනත් සංකේත අතර මත්ස්‍ය සංකේතය, වේදිය සහිත ස්වස්තිකය, ඊතල සංකේත, සමපාද චතුරස්‍රාකාර සංකේත, සමපාද ත්‍රිකෝණයක මුදුනෙහි ඇඳි තිරස් රේඛාවක් මත ඇති යෂ්ටියක් සහිත සංකේත ආදිය ගොන්නෑව දේවාලය, කතරගම, ගරඬිගල, කිරිගල්ලෑව ඇතුලු මෙරටින් ලැබී ඇති ශිලා ලේඛන බොහෝ ප්‍රමාණයක අවසානයෙහි සඳ, හිරු, වටාපත්, බලු, කපුටු, උරග, ප්‍රේත ආදී රූප බොහෝ ප්‍රමාණයක් දක්වා තිබේ. දූවේගල ලිපියේ ඇති නැවක සංකේතයක්, ජේතවනාරාම සංස්කෘත ලිපියේ දක්වා ඇති පියුම් සංකේතයක්, වේවැල්තැන්න ලිපියක ස්වස්තිකය, චෛත්‍යය, චක්‍රය, ත්‍රිශූලය, හතරෙ ඉලක්කම වැනි සලකුණක් ආදී සංකේත පහක් ඇතුළත්වී තිබේ. මේවාට අමතරව බොහෝ විට චක්‍ර, ත්‍රිශූල, සංඛ, පුන්කලස්,

පහත් වැනි සංකේත ද ඇතැම් ශිලාලේඛනවල තිබේ. (බණ්ඩාර, 2002:56) (අමරවංශ හිමි, 1969:56, 57).

මෙරටින් හමුවන විවිධ සංකේත පිළිබඳ හැදෑරීමේ දී ඇතැම්විට බෞද්ධාගමික ආරාමවල ඇති ස්මාරක ආශ්‍රිතව චිත්‍ර වශයෙන් ද සැලකිය හැකි කුරුටු සංකේත විශාල ප්‍රමාණයක් හඳුනාගත හැකි ය. මේවායේ ඇති විශේෂත්වය වන්නේ වැඩි ප්‍රමාණයක් කළුගල් පුවරු මතුපිට සටහන් කොට පැවතීම ය. ඇතැම් විට මෙවැනි සංකේත ගඩොල්, උළු හා මැටිබඳුන් මතුපිට ද සටහන් කොට ඇත. බෞද්ධාගමික ආරාමවල වැඩි වශයෙන් මෙවැනි සටහන් දැකිය හැක්කේ ස්තූප සලපතල මළු ආශ්‍රිතව ය. එයට අමතරව පඩිපේලි, ප්‍රාකාර හා බිත්ති මතුපිට ද යම් අයුරකින් එවැනි කුරුටු සංකේත සටහන් කොට තිබේ. ඉන් බොහෝමයක් සංකේත අතර අතීත සමාජයට අයත් කලින් කල පැවැති විවිධ කුල ගෝත්‍ර, විවිධ වෘත්තීන්වලට අයත් සංකේත, වඩු සංකේත, ජීවිතයේ යහපත උදාකර ගැනීම සඳහා අනුගමනය කරන ලද අභිචාරීමය කටයුතුවලට යොදාගත් සංකේත ආදිය පවතින බැව් අනුමාන වශයෙන් පැවසිය හැකි ය (සද්ධානන්ද හිමි, 2017:5, 212).

ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය මගින් 2017 වර්ෂයේ දී අනුරාධපුර පූජා නගරයේ ඇති ස්තූප ආශ්‍රිතව සිදුකරන ලද පර්යේෂණයක දී මෙවැනි සංකේත සටහන් විශාල ප්‍රමාණයක් අනාවරණය කරගෙන තිබේ. එහි දී ථූපාරාමය සංකේත 07, මිරිසවැටිය සංකේතය 12, අගයගිරිය සංකේත 546, ලංකාරාමය සංකේත 29 ආදී වශයෙන් සමස්ථය සංකේත 694 ක ප්‍රමාණයක් මෙම ස්තූප හතර ඇසුරින් පමණක් අනාවරණය කොටගෙන තිබේ (එම:5).

මෙම සංකේත පැහැදිලිව හැඳනගත හැකි හා පැහැදිලිව හැඳිනගත නොහැකි වශයෙන් බෙදා දක්වා ඇති අතර පැහැදිලිව හැඳිනගත හැකි සංකේත වශයෙන් ස්වස්තිකය, ත්‍රිරත්නය, සිරිවසය, මත්ස්‍ය සංකේතය, පෙති දෙක හෝ තුන නිරූපිත නැට්ට සහිත කුඩා නෙළුම් පොහොට්ටුව, පිපුණු නෙළුම, ජ්‍යාමිතික යන්ත්‍ර, ස්ත්‍රී හා පුරුෂ මානව රූප, විවිධ ඉදිකිරීම්, ස්ථූප, හෙන්ඩුව, හංස හා කපුටු රූප, පුන්සඳ, අඩසඳ, කිණිස්ස, ඔටුන්න, ඉබ්බා, ස්ත්‍රී හා පුරුෂ ලිංග රූප, ඇතා, කතිර සංකේත ආදිය වෙයි (එම:212).

මෙම සංකේත ඒවා නිර්මාණය කරන ලද මිනිසුන්ගේ අවශ්‍යතා ඉටුකර ගැනීම හා ඔවුන්ගේ අනන්‍යතා ගම්‍ය කිරීම සඳහා පැහැදිලි වශයෙන් කුමක් හෝ අර්ථයක් අර්ථවත් කිරීමට සටහන් කොට තිබේ. ඒවායෙහි සමාජීය දෘෂ්ටියක් හා දාර්ශනික දෘෂ්ටියක් පවතී (එම:212).

1996 වර්ෂයේ දී සිදුකරන ලද පුරාවිද්‍යා පර්යේෂණයක දී හම්බන්තොට රිදියග මින් කාලරක්තවර්ණ මැටි බඳුන් කැබලි මත සටහන් කොට පැවැති අක්ෂර නොවන සංකේත බොහෝ ප්‍රමාණයක් ද සොයාගෙන තිබේ. මැටිබඳුන් පිළිබඳ අධ්‍යයනය කරන උගතුන්ගේ අදහස වන්නේ කාලරක්තවර්ණ බඳුන් ප්‍රොටෝ ඓතිහාසික යකඩ යුගය නැතහොත් මෙගලිතික සංස්කෘතිය පැවති කාලයට අයත් වන බවයි. රිදියගමින් ලැබී ඇති මෙම මැටි බඳුන් කොටස් ද එම යුගයට අයත් වන බැව් සිතිය හැකි ය (බණ්ඩාර, 2002:58).

රිදියගමින් ලැබී ඇති මෙම මැටිබඳුන් කැබලි මත ඇති සංකේත මෙරට අක්ෂර භාවිතයට පූර්වයෙන් භාවිත වූ සංකේත වශයෙන් සැලකේ. මෙවැනි සංකේත මෙරට වෙනත් මහා ශිලා සුසාන වලින් ද අනාවරණය වී ඇත. රිදියගමින් ලැබෙන සංකේත අතර වේදිය සහිත ස්වස්තිකයේ පහළ කොටසට සමාන සංකේත පවතී. යාපහුව පින්වැව මෙගලිතික සුසාන භූමියේ ඇතැම් සොහොන් පියන් ගල් මත ද මෙවැනි ආකාරයේ අක්ෂර නොවන සංකේත කිහිපයක් හඳුනාගෙන ඇත (එම:58,59).

රිදියගමින් ලැබී ඇති මෙම සංකේත අතර ස්වස්තික ලකුණු සහ ඔරුවක රූපය ගම්‍ය වන සංකේත රැසක් වෙයි. ඉන්දියාවේ කාලරක්තවර්ණ මැටිබඳුන් මත පැවති මෙවැනි විවිධ සංකේත ද අනාවරණය වී තිබේ. ඔරුවක රූපය දැක්වෙන සංකේත අතර කුඹගස දැක්වෙන ආකාරයේ සංකේත ද ඇත (එම:59,60).

මෙම සංකේත විශේෂවලට අමතරව ගල්ලෙන් බිත්ති මත හා පර්වත බිත්ති මත ඇඳ ඇති කුරුටු හා චිත්‍ර සංකේත විශාල ප්‍රමාණයක් ද මෙරට විවිධ ස්ථානවලින් හමුවී ඇත. අළුගල්ගේ, දොරවකකන්ද, තරුලෙන්ගල, ඇතුළු තවත් ගල්ලෙන් රැසක මෙරට අතීත වැසියන් විසින් අඳින ලද විවිධාකාර රූප හා ජ්‍යාමිතික රටා සංකේත සමුදායක් පවතී. මේවා තම අදහස් අන්‍යයන්ට සන්නිවේදනය කිරීම සඳහා ඇඳ ඇත (සෝමදේව, 2016:26).

අක්ෂර ලිවීම ආරම්භ කරන ලද සෑම අතීත සමාජයක ම එය සිදු කිරීමට ප්‍රථමව සිදුකර ඇත්තේ රූප සංකේත ඇඳීමයි. අප රටේ විසූ ජනයා ද එය ඒ ආකාරයෙන් ම සිදු කළ බවට වන සාධක එවැනි  රූප සංකේත බොහෝ ප්‍රමාණයක් පවත්නා ගල්ගුහා ඇසුරෙන් ලැබේ. ඒ සඳහා එක් උදාහරණයක් ලෙස අම්පාර තරුලෙන්ගල ගල්ලෙනේ ඇඳ ඇති කිඹුලෙකුගේ යැයි අනුමාන කළ හැකි රූප සංකේතය දැක්විය හැකිය. ඉන් අදහස් කොට ඇත්තේ එය ඇඳ ඇති ගුහාව ආසන්නයේ ජලය රැඳෙන ස්ථානයක සිටි කිඹුලෙක් පිළිබඳව අන් අයට සන්නිවේදනය කිරීමයි. එසේම මෙවැනි රූප සංකේත තුළ ජලය සංකේතවත් කිරීම තිත් පේළි යෙදීමෙන් සිදු කර ඇති අතර මෙම කිඹුල් රූප සංකේතයේ ද ජලය සංකේතවත් කොට ඇත්තේ කිඹුල් රූපය වටා තිත් පේළි ඇඳීමෙනි (එම:27,28).

කෑගල්ල දිස්ත්‍රික්කයේ දොරවකකන්ද ගල්ලෙනෙහි ද කුරුටු රූප සංකේත බොහෝ ප්‍රමාණයක් පවතී. මෙහි ඇති සංකේත අතර ඉර, හඳ, මත්ස්‍ය රූප, තලගොයා, ඇත් රූප ඇතුළු තවත් රූප සංකේත පවතී. මෙම රූප සංකේත තුළින් ගම්‍ය වන්නේ මෙම සංකේත අඳින ලද පිරිස තමන් ජීවත්ව සිටි පරිසරයේ පැවති දෑ පිළිබඳ අදහසක් සන්නිවේදනය කොට ඇති බවකි (එම:31).

පුරාතන සමාජවල සන්නිවේදන කටයුතු සඳහා සංකේත යෙදීමේ දී සජීවී හා අජීවී දේවල් මෙන් ම මනඃකල්පිත දෑ ද යොදාගෙන තිබේ. විශේෂ වශයෙන් මෙහි දී සුබ සංකේත භාවිතය පිළිබඳ එකල සමාජය තුළ විස්වාසයක් පැවත තිබී ඇත. මෙරට දී වැස්ස, ජලය, සෞභාග්‍ය, රාජ්‍යත්වය, ආඪ්‍යබව වැනි දෑ අර්ථවත් කිරීම සඳහා මකරා, සිංහයා, හස්තියා, හංසයා, පුන්කලශ, ශ්‍රීවත්ස ආදී සංකේත යොදාගෙන ඇත. පසු කාලය වන විට ඇතැම් සංකේතවල ආරම්භයේ දී ඒවා භාවිත කළ අරමුණු ගිලිහී ගොස් සැරසිලි කටයුතු සඳහා සැරසිලි වශයෙන් පමණක් භාවිත කොට ඇත (අමිල හිමි, 1999:2,3,4).

**සමාලෝචනය**


පූර්වයෙහි පැහැදිලි කරනලද ආකාරයට විවිධ විද්වතුන් දක්වා ඇති අදහස් කැටිකොට ගත්විට විවිධ කාලවකවානුවලට අයත් මෙරට විවිධ ස්ථානවලින් හා ලොව විවිධ ස්ථානවලින් හමුවන කුරුටු සංකේත පිළිබඳ විමැසීමේ දී ඒවා පිළිබඳ නිගමන කිහිපයකට එළඹිය හැකිවේ.

පළමුව පෙන්වාදිය යුතුවන්නේ මෙලෙස හමුවන විවිධ සංකේතවලින් යම් අදහසක් ගම්‍ය කෙරෙන බව දක්වන ඇතැම් විද්වතුන් ඒවායින් යම් සංකේත ප්‍රමාණයක් පිළිබඳ පැහැදිලි කිරීමට උත්සහකොට ඇති බවයි. එසේ වුව ද එම පැහැදිලි කිරීම් පිළිබඳ උගතුන් අතර එකඟතා නොමැත. උදාහරණ ලෙස ස්වස්තික සංකේතය පිළිබඳ විවිධ අදහස් පැවතීම පෙන්වාදිය හැකි ය. එසේ වුව ද මෙතෙක් හමු වී ඇති සියලු සංකේත පිළිබඳ එසේ පැහැදිලි කිරීමක් සිදු වී නොමැත.

මෙසේ හමුවන විවිධ සංකේත විමසා බැලීමේ දී පෙනීයන කරුණක් වන්නේ ඒවා ඉතා ඈත අවධියක සිට පැවත එන බවයි. එනිසා ම මෙම සංකේත වර්තමාන සමාජයෙන් ගිලිහී ඇති අතීතයේ භාවිතයෙහි පැවති මළ භාෂා යනුවෙන් හඳුන්වනු ලබන කිසියම් භාෂා විශේෂයකට හෝ කිහිපයකට අයත්ව පැවති තත්කාලීනව එම භාෂාවන්හි ශබ්ද සංකේතවත් කිරීම සඳහා යොදන ලද අක්ෂරවලට සමාන සංකේත විශේෂයක් සේ සිතිය හැකි ය. මෙවැනි සංකේත විවිධ කාර්යයන් සඳහා වර්තමානයේ ද මිනිසුන් භාවිත කෙරේ. එනිසා මෙම සංකේත අයත්ව පැවති භාෂා මළ භාෂා බවට පත්වුව ද ඒවායෙහි පැවති ඇතැම් සංකේත අතීතයේ සිට ම විවිධ කාර්යයන් සඳහා මිනිසුන් විසින් දීර්ඝ කාලයක් භාවිත කළ බැවින් වර්තමානයට ද ඒවා පැමිණ ඇති බැව් නිගමනය කළ හැකිවේ.

එසේ ම මෙම සංකේත ආගමික කටයුතු වෙනුවෙන් යොදාගන්නා ලද ශුද්ධ භාෂාවකට හෝ කීපයකට අයත් ශේෂ වශයෙන් ද සැලකිය හැකි ය. එම භාෂා වර්තමානය වනවිට කිසිදු ආකාරයකින් තොරතුරු අණාවරණය කරගත නොහැකි ආකාරයේ මළ භාෂා බවට පත්ව තිබිය හැකිය. එම ආගම් හෝ ඇදහිලි ක්‍රි:පූ 6 වන සියවසට පෙර පැවති ඒවා විය හැකිය. ඒවායෙහි ආභාෂය හිංදු හා බෞද්ධ වැනි ආගම් වෙත ද ලැබී ඇති බැව් එම ආගමික ක්‍රියාකාරකම් හා ඒවාට අයත් ලේඛන තුළ මෙවැනි සංකේත පැවතීමෙන් පෙනීයයි.


මීට අමතරව ඉන්දීය සංදර්භයට අයත් භූමි කලාපය තුළ අභිචාරමය කටයුතු සඳහා යොදාගන්නා ලද සංකේත සමුදායක් වශයෙන් ද මේවා හැඳින්විය හැකි ය. ඉන්දියාවෙහි ප්‍රභවය වී සංක්‍රමණ හෝ වෙනත් මානව කටයුතු ඇසුරෙන් මෙරටෙහි ද මෙම සංකේත අභිචාරමය කටයුතු සඳහා භාවිතයට ගෙන ඇති බැව් පෙනී යයි. වර්තමානයේ ද යම් අභිචාරමය කටයුතු වෙනුවෙන් මෙවැනි සංකේත භාවිත කරනු ලැබේ. උදාහරණ ලෙස කිරි ඉතිරවීමේ දී මුට්ටි මත සංකේත ඇඳීම, දේවාලවල හා කෝවිල්වල දේව ආයුධ තැනීමේ දී හා සෙත් ශාන්ති කිරීමේ දී මෙවැනි සංකේත භාවිත කරන බැව් පෙන්වා දිය හැකිය. එනිසා විශේෂයෙන් මේවා හමුවන ස්ථාන වන ස්ථූප සලපතල මළු, මෙගලිතික සුසාන, ගල්ලෙන් වැනි ස්ථානවල ස්වභාවය අනුව හා වර්තමානයේ දී මෙවැනි සංකේත භාවිත කරන ආකාරය අනුව මේවා අභිචාරමය කටයුතු වෙනුවෙන් අතීතයේ දී භාවිත කර ඇතැයි සිතිය හැකිවේ.



(බණ්ඩාර, 2002:60)



(එම:61)



(එම:62)

## ආශ්‍රිත ග්‍රන්ථ


අමරවංශ හිමි, කොත්මලේ, (1969), ලක්දිව සෙල්ලිපි, ඇස්.ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ.

අමිල හිමි, දඹර, (1999), ලංකාවේ කලා ශිල්පවල දක්නට ලැබෙන ශුභ සංකේත, කර්තෘ ප්‍රකාශන, කුඩා උඩුව.

කරුණාතිලක, ඩබ්ලිව්.එස්, (2006), ඓතිහාසික වාග්විද්‍යා ප්‍රවේශය, එස්. ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ.

කුලතිලක, සමන්ති, (2018), මානව අතීතය, සරසවි ප්‍රකාශකයෝ, නුගේගොඩ.

ගුණසේකර, බන්දුසේන, (2009), සිංහල හෝඩිය දැනගත් ඉඳුරා, දයාවංශ ජයකොඩි සහ සමාගම, කොළඹ.

දිසානායක, ජේ.බී, (2005), මානව භාෂා ප්‍රවේශය, සුමිත ප්‍රකාශන, කළුබෝවිල.

බණ්ඩාර, තිස්ස, වයි.කේ, (2002), ''හම්බන්තොට ආශ්‍රිත ඓතිහාසික පුරාවිද්‍යාව පිළිබඳ විමසුමක්'', සංස් - බාලසූරිය, ඉනෝකා දමයන්ති සහ වීරසිංහ, ඩබ්ලිව්, වැලිපිළ පුරාවිද්‍යා සඟරාව, පස්වෙනි කලාපය, ඒකාබද්ධ උපාධිධාරී සංගමය, මධ්‍යම සංස්කෘතික අරමුදල, කොළඹ.

වජිර හිමි, හබරකඩ, (2000), ''ප්‍රාග් ඓතිහාසික ගුහා සිතුවම් ආශ්‍රයෙන් බිහිවූ සිංහල අක්ෂර කලාව'', සංස් - කුලතුංග, ටී.ජී, සංස්කෘතික පුරාණය, 3 වෙළුම - 3 කලාපය, මධ්‍යම සංස්කෘතික අරමුදල, කොළඹ.

සද්ධානන්ද හිමි, බැරගම, (2017), ඓතිහාසික ස්මාරක ස්ථාන ආශ්‍රිත කුරුටු සටහන් සංකේත, පුරාවිද්‍යා අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය, හෝමාගම.

සෝමදේව, රාජ්, (2016), ශ්‍රී ලංකාවේ ආදි ඉතිහාසය, ගුරුළුගෝමී ප්‍රකාශකයෝ, මහරගම.